*සැ. යු.*- 2018.05.11 දින පළ වූ අංක 2,071 දරන *ගැසට් පත්‍රයේ* I : III කොටස පළ නොවීය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,072 - 2018 මැයි මස 18 වැනි සිකුරාදා - 2018.05.18**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)

## IV (අ) වැනි කොටස - පළාත් සභා

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)

| | පිටුව |
|---|---|
| ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය ... ... | — |
| ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද පත්කිරීම් ආදිය ... ... | — |
| වෙනත් පත්කිරීම් ... ... ... ... | — |
| පළාත් සභා නිවේදන ... ... ... ... | — |
| අතුරු ව්‍යවස්ථා ... ... ... ... | — |
| තනතුරු ඇබෑර්තු ... ... ... ... | — |
| විභාග විභාග ප්‍රතිඵල ආදිය ... ... ... ... | 920 |
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් ... ... ... ... | — |
| බඩු බාහිරාදිය විකිණීම් ... ... ... ... | — |
| තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම් ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... ... | — |

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර (එනම්, 2018 ජුනි මස 08 වැනි දින පළ කරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2018 මැයි මස 25 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර) තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."*

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති (*වැ. බ.*)

2018 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www. documents.gov. lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

## බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ භාෂා පරිවර්තක II ශ්‍රේණියේ තනතුරු සඳහා බඳවා ගැනීම - 2018

බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ භාෂා පරිවර්තක සේවයේ පහත සඳහන් තනතුරුවල පුරප්පාඩු පිරවීම සඳහා සුදුසුකම් ඇති අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

*01.*

| *තනතුරු නාමය* |
|---|
| ➢ භාෂා පරිවර්තක (සිංහල/දෙමළ) |
| ➢ භාෂා පරිවර්තක (දෙමළ/ඉංග්‍රීසි) |

02. අයදුම්පත් භාර ගනු ලබන අවසාන දිනය : 2018.06.18

*03. 3.1 පොදු සුදුසුකම් :*

අ) ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.

ආ) යහපත් චරිතයකින් හා මනා සෞඛ්‍ය තත්වයකින් යුක්ත විය යුතුය.

ඇ) ඉල්ලුම්පත් භාර ගන්නා අවසාන දිනට පූර්වාසන්න වසර 03 ක කාලයක් බස්නාහිර පළාත තුළ අඛණ්ඩ ස්ථිර පදිංචිය තිබිය යුතුය.

ඈ) ඉල්ලුම්පත්‍ර භාර ගැනීමේ අවසාන දිනට වයස අවු. 22 ට වැඩි විය යුතු අතර අවු. 45 ට නොවැඩි විය යුතුය. (දැනටමත් රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර තනතුරක් දරන අය සඳහා උපරිම වයස් සීමාව අදාළ නොවේ.)

*04. සේවා කොන්දේසි :*

මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. ඔබට හිමි විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේදී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයකට ඔබ යටත් විය යුතුය. තවද අනුමත සේවා ව්‍යවස්ථාව හා රජය විසින් පනවනු ලබන සේවා කොන්දේසිවලට යටත් වේ.

*05. අධ්‍යාපන සුදුසුකම් :*

5.1 විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් උපාධියක් ලබා තිබීම.

*සහ*

5.2 අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේ දී මව් භාෂාව සඳහා සම්මාන සාමාර්ථයක් ලබා තිබීම.

*සහ*

5.3 දෙවැනි භාෂාව සඳහා සම්මාන සාමාර්ථයක් ලබා තිබීම.

**සිංහල/දෙමළ භාෂා පරිවර්තකයින් සඳහා**

අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේදී මව්බසට සම්මාන සාමාර්ථයක් සමඟ අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) හෝ ඊට සමාන විභාගයකදී දෙමළ භාෂාවට සම්මාන සාමාර්ථයක් ලබා තිබීම.

*හෝ*

දෙමළ භාෂාව පිළිබඳව පිළිගත හැකි ඊට උසස් සුදුසුකමක් ලබා තිබීම.

**දෙමළ/ඉංග්‍රීසි භාෂා පරිවර්තකයින් සඳහා**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේදී මව්බසට සම්මාන සාමාර්ථයක් සමඟ අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) හෝ ඊට සමාන විභාගයකදී ඉංග්‍රීසි භාෂාවට සම්මාන සාමාර්ථයක් ලබා තිබීම;

*හෝ*

ඉංග්‍රීසි භාෂාව පිළිබඳව පිළිගත හැකි ඊට උසස් සුදුසුකමක් ලබා තිබීම.

*06. වැටුප් ප්‍රමාණය :*

අංක 03/2016 හා 2016.02.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ උපලේඛන 1ට අනුව, මෙම තනතුරට අදාළ මාසික වැටුප් පරිමාණය රු.36,585 - 10x660 - 11x755 - 15 x930 - රු.65,440/- (MN6-2016) වේ. නමුත් ඔබට වැටුප් ගෙවනු ලබන්නේ එම චක්‍රලේඛයේ විධිවිධානවලට අනුකූලව එහි උපලේඛන II හි සඳහන් පරිදි වේ.

*07. බඳවා ගැනීමේ ක්‍රමය :*

අයදුම්කරුවන් පහත සඳහන් ලිඛිත පරීක්ෂණයට භාජනය විය යුතුය. විභාගය සමත් අයදුම්කරුවන්ගේ ලකුණු අනුපිළිවෙල අනුව සම්මුඛ පරීක්ෂණයට භාජනය කිරීමෙන් අනතුරුව පුරප්පාඩු සඳහා බඳවා ගනු ලැබේ.

7.1 **විභාගය සම්බන්ධ විස්තර**
විභාගය පහත සඳහන් විෂයයන් පිළිබඳ ප්‍රශ්න පත්‍රවලින් සමන්විත වේ.

| විෂයය | කාලය | උපරිම ලකුණු ප්‍රමාණය | සමත්වීමට අවශ්‍ය ලකුණු ප්‍රමාණය |
|---|---|---|---|
| පරිවර්තනය | පැය 03 යි | 100 | 40 |
| ඉංග්‍රීසි භාෂාව | පැය 01 විනාඩි 30 | 100 | 40 |
| සිංහල භාෂාව | පැය 01 විනාඩි 30 | 100 | 40 |
| දෙමළ භාෂාව | පැය 01 විනාඩි 30 | 100 | 40 |
| අවබෝධය | පැය 01 විනාඩි 30 | 100 | 40 |

**විභාග විෂයය නිර්දේශය**

7.1.1 පරිවර්තනය - කාර්යාලයීය ලියවිල්ලකින් හෝ වාර්තාවකින් හෝ පුවත්පත් ලිපියකින් හෝ උපුටා ගන්නා ලද උධෘතයක් ඇතුළු කාර්යාලයීය, විද්‍යාත්මක, නෛතික හා තාක්ෂණික ලියකියවිලි වලින්ද, සම්භාව්‍ය සාහිත්‍ය ග්‍රන්ථවලින්ද උපුටා ගත් දුෂ්කර පාඨ කිහිපයක් පහත දැක්වෙන ආකාරවලින් එකක් අනුව පරිවර්තනය කිරීම.

I. සිංහල බසින් දෙමළ බසට සහ දෙමළ බසින් සිංහල බසට
II. දෙමළ බසින් ඉංග්‍රීසි බසට හා ඉංග්‍රීසි බසින් දෙමළ බසට පරිවර්තනයෙහිදී ඉතා උසස් කුසලතාවයක් අපේක්ෂිතය.

7.1.2 ඉංග්‍රීසි/සිංහල/දෙමළ භාෂා ප්‍රශ්න පත්‍ර - මේ සඳහා භාෂා තුනෙන්ම ප්‍රශ්න පත්‍ර පිළියෙල කරන අතර, ඉන් අදාල භාෂා දෙකක ප්‍රශ්න පත්‍ර වලට අපේක්ෂකයන් පෙනී සිටිය යුතුය.

7.1.3

(i) ඉංග්‍රීසි භාෂාව - දෙන ලද රචනයෙහි සළකුණු කරන ලද වචන යොදා ඒවායේ අර්ථ පැහැදිලි වනසේ වාක්‍ය තැනීම, වාග් සම්ප්‍රදායන් තේරුම් කිරීම, සංයුක්ත හා සංකීර්ණ වාක්‍ය ඛණ්ඩවලට විග්‍රහ කිරීම.

(ii) සිංහල භාෂාව - රචනයක් ලිවීම, සාරාංශයක් ලිවීම, දෙන ලද ඡේදයක් සංක්ෂිප්ත කොට තම වචනයෙන් ප්‍රකාශ කිරීම, වචනවල අර්ථ නිරූපන ලෙස වාක්‍ය තැනීම, වාක්‍යයන්හි ව්‍යාකරණ නිවැරදි කිරීම, වාග් සම්ප්‍රදායන් තේරුම් කිරීම.

(iii.) දෙමළ භාෂාව - රචනයක් ලිවීම, සාරාංශයක් ලිවීම, දෙන ලද ඡේදයක් සංක්ෂිප්ත කොට තම වචනයෙන් ප්‍රකාශ කිරීම, වචනවල අර්ථ නිරූපන ලෙස වාක්‍ය තැනීම, වාක්‍යයන්හි ව්‍යාකරණ නිවැරදි කිරීම, වාග් සම්ප්‍රදායන් තේරුම් කිරීම.

7.1.4 අවබෝධය - සිංහල/දෙමළ/ඉංග්‍රීසි යන භාෂා තුනෙන්ම පිළියෙල කරනු ලබන අවබෝධය ප්‍රශ්න පත්‍රය සඳහා තමන් කැමති එක් භාෂාවකින් පිළිතුරු සැපයීමට අපේක්ෂකයෙකුට ඉඩ දෙනු ලැබේ.

මේ සඳහා පාඨ ගණනාවක් අපේක්ෂකයින්ට දෙනු ලැබේ. ඇතැම් පාඨයන් සම්බන්ධයෙන් අපේක්ෂකයා වෙත විකල්ප ප්‍රකාශයන් ගණනාවක් ඉදිරිපත් කෙරෙන අතර, ඉන් එකක් එම පාඨයේ ඇති කරුණුවලට වඩාත්ම හොඳින් ගැලපේ.

අපේක්ෂකයා වඩාත්ම උචිත ප්‍රකාශය තෝරා ගත යුතු වේ. අනික් පාඨයන් සම්බන්ධයෙන් ප්‍රශ්න පිළියෙල කරනු ලබන්නේ අපේක්ෂකයා එම පාඨවල අර්ථය වටහා ගන්නා ප්‍රමාණය පරීක්ෂා කිරීමට හැකි වන පරිදිය.

*සැ.යු.* අපැහැදිලි අත් අකුරු හා අක්ෂර වින්‍යාස දෝෂ සඳහා ලකුණු අඩු කරනු ලැබේ. අත් අකුරු කියවිය නොහැකි අපේක්ෂකයෙකුගේ සුදුසුකම අවලංගු කලහැක.

7.2 මෙම විභාගයෙන් සුදුසුකම්ලත් අපේක්ෂකයින්ගේ නම් ඇතුළත් ප්‍රතිඵල ලේඛණය බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අයදුම්කරුවන් වෙත පෞද්ගලිකව ප්‍රතිඵල දන්වා යැවීම, තැපැල මගින් හෝ බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ www.psc.wp.gov.lk නිල වෙබ් අඩවිය ඔස්සේ සිදු කරන ඇත.

*08. අයදුම් කිරීමේ ක්‍රමය :*

8.1 විභාග ගාස්තුව රු. 600/- කි. මෙම විභාග ගාස්තුව බස්නාහිර පළාත තුල පිහිටා ඇති ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකට බස්නාහිර පළාත් ආදායම් ශීර්ෂ 20-03-02-99 ට බැර වන ලෙස මුදලින් ගෙවා ඒ සඳහා නිකුත් කරන කුවිතාන්සිය අයදුම්පත්‍රයට නොගැලවෙන සේ ඇලවිය යුතුය.

8.2 අයදුම්පත්‍රය මෙම නිවේදනයට අමුණා ඇති ආදර්ශ ආකෘතියට අනුව නිවැරදිව සම්පූර්ණ කොට 2018.06.18 වැනි දින හෝ ඊට පෙර ලැබෙන සේ "ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව, අංක 109, මහවීදිය, බත්තරමුල්ල" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත් ලද බව දන්වනු නොලැබේ. අයදුම්පත් බහාලන කවරයේ වම්පස ඉහළ කෙළෙවරේ "**බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ භාෂා පරිවර්තක II ශ්‍රේණියේ තනතුරු සඳහා බඳවා ගැනීමේ තරග විභාගය - 2018**" යනුවෙන් සඳහන් කල යුතුය. නියමිත දිනට පසුව ලැබෙන අයදුම්පත් සහ අවශ්‍ය සුදුසුකම් සපුරා නොමැති සහ අසම්පූර්ණ අයදුම්පත් දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

8.3 මෙම අයදුම්පත් කැඳවීමේ නිවේදනයෙන් ආවරණය වන/නොවන සියළු කරුණු පිළිබඳ අවසාන තීරණය බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතු වේ.

09. මෙම *ගැසට්* නිවේදනය සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි අනුවාද අතර යම් අනනුකූලතාවයක් ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතුය.

10. මෙම දැන්වීම හා ආදර්ශ අයදුම් පත්‍රය බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ www.psc.wp.gov.lk නිල වෙබ් අඩවියේ ද පළකර ඇත.

එම්.ජී.ඒ. තිලකරත්න,
ලේකම්,
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
බස්නාහිර පළාත.

2018 අප්‍රේල් මස 25 වැනි දින.

ආදර්ශ අයදුම්පත්‍රය

**බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ භාෂා පරිවර්තක II වැනි ශ්‍රේණියට බඳවා ගැනීම සඳහා වන විවෘත තරග විභාගය - 2018**

Open Competitive Examination for Recruitment to Grade II of Western Provincial Translater - 2018

| |
|---|
| |

(කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා)

* නිවේදනයේ අංක 1 අනුව ඉල්ලුම්කරන තනතුරු නාමය අනුව අදාල කොටුව තුළ ✓ලකුණ යොදන්න.

| | |
|---|---|
| භාෂා පරිවර්තක (සිංහල/දෙමළ) | |
| භාෂා පරිවර්තක (දෙමළ/ඉංග්‍රීසි) | |

භාෂා මාධ්‍ය
අවබෝධය ප්‍රශ්න පත්‍රය
සඳහා පෙනී සිටින භාෂා මාධ්‍යය
(අදාළ කොටුව තුළ ✓ලකුණ යොදන්න)

| | |
|---|---|
| සිංහල | |
| දෙමළ | |
| ඉංග්‍රීසි | |

ඉල්ලුම් කරන තනතුර අනුව භාෂා මාධ්‍ය දෙක
(අදාළ කොටුව තුළ ✓ලකුණ යොදන්න)

| | |
|---|---|
| සිංහල | |
| දෙමළ | |
| ඉංග්‍රීසි | |

1.0 1.1 සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) :- ....................................................................................................................................

(උදා:HERATH MUDIYANSELAGE SAMAN KUMARA GUNAWARDHANA)

1.2 අගට යෙදෙන නම මුලින් ද අනෙකුත් නම්වල මුලකුරු පසුව ද යොදා නම (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) :-....................................................................................................................................

(උදා:GUNAWARDHANA, H.M.S.K.)

1.3 සම්පූර්ණ නම (සිංහලෙන්/දෙමළෙන්)

1.4 ජාතික හැඳුනුම්පත් අංකය : | | | | | | | | | | | | |

2.0 2.1 ස්ථිර ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :-....................................................................................................................................

2.2 ස්ථිර ලිපිනය (සිංහලෙන්/ දෙමළෙන්) :- ....................................................................................................................................

2.3 විභාග ප්‍රවේශ පත්‍ර එවිය යුතු ලිපිනය :
(i.) සිංහලෙන්/දෙමළෙන් - ..................................................................................
(ii.) ඉංග්‍රීසි කැපිටල් අකුරින් - ..................................................................................

2.4 දුරකතන අංකය :
පුද්ගලික- ........................................ රාජකාරි- ........................................

3.0 3.1 ඔබ දැනට රැකියාවක නිරත වන්නේනම් දරන තනතුර :- ..................................................................................

3.2 අදාළ තනතුරේ පත්වීම් දිනය හා 2018.06.18 දිනට සේවා කාලය : ..................................................

3.3 අදාළ තනතුර අයත්වන ක්ෂේත්‍රය :- ..................................................

3.4 ඔබ විසින් දරන තනතුර අයත්වන්නේ රජයේ/පළාත් රාජ්‍ය සේවයේ/රාජ්‍ය සංස්ථාවක/වෙනත් ආයතනයකටද යන්න සඳහන් කරන්න. :- ..................................................

3.5 අදාළ ආයතනයේ නම හා ලිපිනය :- ..................................................

3.6 රාජකාරි දුරකථන අංකය :- ..................................................

4.0 ස්ත්‍රී/පුරුෂ භාවය - (අදාළ අංකය කොටුව තුළ ලියන්න)
පුරුෂ - 0
ස්ත්‍රී - 1
☐

4.1 අයදුම්කරුගේ ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය - කොළඹ - 1
ගම්පහ - 2
කළුතර - 3 (අදාළ අංකය කොටුව තුළ ලියන්න) ☐

4.2 ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය - ..................................................

4.3 බස්නාහිර පළාතේ ස්ථිර පදිංචි කාලය - අවු: ☐☐ මාසඃ ☐☐ දිනඃ ☐☐

4.4 ඔබ ශ්‍රී ලංකා පුරවැසියෙකු වන්නේ උපතින්ද? ලියාපදිංචියෙන්ද? ..................................................

4.5 විවාහක/අවිවාහක බව - විවාහක - 2 අවිවාහක - 1 ☐
(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

4.6 උපන් දිනය වර්ෂයඃ ☐☐☐☐ මාසයඃ ☐☐ දිනයඃ ☐☐

4.7 අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදුඃ ☐☐ මාසඃ ☐☐ දිනඃ ☐☐

5.0 අධ්‍යාපන සුදුසුකම්ඃ
(අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ 05 අනුව ඉල්ලුම් කරන තනතුරට අදාළ සුදුසුකම් දැක්විය යුතු අතර පිටපත් ඇමිණිය යුතුය.)

5.1 උපාධිය පිළිබඳ විස්තර :
- උපාධියේ නම -
- විශ්වවිද්‍යාලයේ නම -
- උපාධිය වලංගු දිනය -

5.2 නිවේදනය අනුව අ.පො.ස. (සා/පෙළ) විභාගය පිළිබඳ විස්තර වර්ෂය .............................. විභාග අංකය ..............................
ඉල්ලුම් කරන තනතුර අනුව,

| | විෂයය | සාමාර්ථය |
|---|---|---|
| මව් භාෂාව | | |
| දෙවන භාෂාව | | |

5.3 අ.පො.ස. (සා.පෙළ) විභාගයේ දී ඉල්ලුම් කරන තනතුරට අදාළ දෙවන භාෂාව සඳහා සම්මාන සාමාර්ථයක් නොමැති නම් ඊට සමාන හෝ උසස් සුදුසුකම පිළිබඳ විස්තර :

5.3.1 දෙවන භාෂාව - (අදාළ කොටුව තුළ ✓ලකුණ යොදන්න)

| | |
|---|---|
| සිංහල | |
| දෙමළ | |
| ඉංග්‍රීසි | |

5.3.2 පාඨමාලාවේ හෝ උසස් සුදුසුකම පිළිබඳ විස්තර (නම සඳහන් කරන්න) -

5.3.3 සහතිකය නිකුත් කරන ආයතනය -

5.3.4 සහතිකය වලංගු දිනය -

6.0 විභාග ගාස්තු ගෙවූ ලදුපත පිළිබඳ විස්තර ：

i. විභාග ගාස්තු ගෙවූ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය - ..............................................................................

ii. ලදුපත් අංකය හා දිනය - ..............................................................................

iii. ගෙවූ මුදල - ..............................................................................

විභාග ගාස්තු ගෙවූ ලදුපත මෙම කොටුව තුළ නොගැලවෙනසේ අලවන්න.

7.0 *අයදුම්කරුගේ සහතිකය ：*

*(අ)* මෙම ඉල්ලුම්පත්‍රයේ මවිසින් සපයා ඇති තොරතුරු මා දන්නා තරමින් සත්‍ය හා නිවැරදි බව ගෞරවයෙන් ප්‍රකාශ කර සිටිමි. මෙහි යම් කොටස් සම්පූර්ණ නොකිරීම සහ / හෝ වැරදි ලෙස සම්පූර්ණ කිරීමෙන් සිදුවිය හැකි අලාභය විඳ දරා ගැනීමට එකඟ වෙමි. මෙහි සියලුම කොටස් නිවැරදිව සම්පූර්ණ කර ඇති බව ද ප්‍රකාශ කරමි.

*(ආ)* මවිසින් කරන ලද මෙම ප්‍රකාශය අසත්‍ය යැයි ඔප්පු වුවහොත්, අදාළ තනතුර සඳහා පත්කරනු ලැබීමට නුසුදුස්සෙකු වන බව සහ පත්වීම ලැබීමෙන් පසු සේවයෙන් පහ කරනු ලැබීමට යටත්වන බව ද මම දනිමි.

*(ඇ)* තව ද විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පනවනු ලබන නීතිරීතිවලට අනුකූලව ක්‍රියා කිරීමටත් මෙම විභාග කොන්දේසි අනුව මා නුසුදුස්සෙකු බව අනාවරණය වුවහොත් විභාගයට පෙර හෝ විභාගයෙන් පසුව හෝ මාගේ විභාග අපේක්ෂකත්වය අවලංගු කිරීමට ගනු ලබන තීරණයන් පිළිගැනීමට මා එකඟ වෙමි.

*(ඈ)* මෙහි සඳහන් කිසිදු තොරතුරක් පසුව වෙනස් නොකරමි.

..............................
දිනය ：........................ අයදුම්කරුගේ අත්සන.

8.0 *අයදුම්කරුගේ අත්සන සහතික කිරීම ：*

මෙම අයදුම්පත ඉදිරිපත් කරනු ලබන .............................................................................. මයා/මිය/මෙනවිය මා පෞද්ගලිකව දන්නා හඳුනන බවත් ඔහු/ඇය නියමිත විභාග ගාස්තුව ගෙවා ඇති බවත්, එම ලදුපත අයදුම්පතෙහි අලවා ඇති බවත්, ඔහු/ඇය ............................. වැනි දින මා ඉදිරිපිට දී ඔහුගේ/ඇයගේ අත්සන තැබූ බවත් සහතික කරමි.

................................................
අත්සන සහතික කරන නිලධාරියාගේ
අත්සන හා නිල මුද්‍රාව.

දිනය ：........................
සහතික කරන නිලධාරියාගේ සම්පූර්ණ නම ：........................
තනතුර ：........................
ලිපිනය ：........................

රජයේ සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය ෑ

මෙම අයදුම්පත ඉදිරිපත් කරන ........................................................................... මයා/මිය/මෙනවිය දැනට ................................ ........................................................ කාර්යාලයේ/ආයතනයේ .................................. දින සිට මේ දක්වා ....................................... ......................... (තනතුර) වශයෙන් ස්ථිර/තාවකාලික/අනියම් (අනවශ්‍ය වචන කපා හරින්න) තනතුරක සේවය කරන බවද, ඔහු/ඇය 2018.06.18 දිනට වසර 05 ක සතුටුදායක සේවා කාලයක් සපුරා ඇති බවද, මෙම තනතුරෙහි පත්වීමක් සඳහා ඔහු/ඇය තෝරාගනු ලැබුවහොත් ඔහු/ඇය දැනට දරන තනතුරින් නිදහස් කරන බවද/ නොකරන බවද, ඉහත සඳහන් කර ඇති තොරතුරු සත්‍ය බවද සහතික කරමි.

........................................
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන හා
නිල මුද්‍රාව.

දිනය ෑ.......................
සහතික කරන නිලධාරියාගේ නම ෑ.......................
තනතුර ෑ....................... .
ලිපිනය ෑ....................... .

05-767

---

## බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ ක්‍රීඩා පුහුණුකරු III ශ්‍රේණියේ තනතුරු සඳහා බඳවා ගැනීම සඳහා අයදුම්පත් කැඳවීම - 2018

බස්නාහිර පළාත් ක්‍රීඩා අමාත්‍යාංශයේ ක්‍රීඩා පුහුණුකරු/දිස්ත්‍රික් ක්‍රීඩා නිලධාරි තනතුරුවලට අදාල බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පරිපාටියේ 1.1 වගන්තිය අනුව ක්‍රීඩා පුහුණුකරු III ශ්‍රේණියේ තනතුරු සඳහා සුදුස්සන් තෝරා ගැනීමේ විවෘත තරග විභාගයක්, බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පවත්වනු ලබන අතර මෙම නිවේදනයේ දක්වා ඇති පරිදි අවශ්‍ය සුදුසුකම් සපුරා ඇති අපේක්ෂකයින්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

02. *පුරප්පාඩු පවතින ක්‍රීඩා ක්ෂේත්‍ර හා පුරප්පාඩු සංඛ්‍යාව:*

පහත සඳහන් ක්‍රීඩා ක්ෂේත්‍රවල පුරප්පාඩු පවති. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට පවත්නා පුරප්පාඩු වලට පමණක් හෝ මතුවට ඇතිවන පුරප්පාඩු වලටද බඳවා ගැනීම පිළිබඳ අවසන් තීරණය බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතු වේ. අදල එක් එක් ක්‍රීඩා ක්ෂේත්‍ර අනුව පවතින පුරප්පාඩු සංඛ්‍යාවට බඳවා ගැනීම සිදු කරනු ලැබේ.

| ක්‍රීඩා ක්ෂේත්‍රය | පුරප්පාඩු ප්‍රමාණය |
|---|---|
| කබඩි | 01 |
| නෙට්බෝල් | 01 |
| වොලිබෝල් | 01 |

03. *සේවා කොන්දේසි:*

(i). මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. ඔබට හිමි විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේදී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයට ඔබ යටත් විය යුතු වේ. ඔබ වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට/වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක විය යුතුය. රජය මඟින් ඒ ඒ අවස්ථාවලදී නියම කරනු ලබන ආකාරයට ඔබ විසින් ඒ සඳහා දායක මුදල් ගෙවිය යුතු වේ.

(ii). ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයට හා බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවයේ කාර්ය පරිපාටික රීති සංග්‍රහයටද, බස්නාහිර පළාත් සභාවේ මූල්‍ය රීති සංග්‍රහයටද, බස්නාහිර පළාත් සභාවේ ගරු ආණ්ඩුකාරතුමා විසින් පනවනු ලබන රෙගුලාසි වලට නොහොත් නියෝගවලටද, බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින්

කලින් කල පනවනු ලබන වෙනත් රෙගුලාසි නොහොත් නියෝග වලටද, අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු නියෝග වලටද අනුව කටයුතු කල යුතුය.

(iii). පත්වීම භාරගත් දින සිට වර්ෂ පහක් ඉකුත්වීමට පෙර, රජයේ ප්‍රතිපත්තිවලට අනුරූපව අනෙක් රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය ලබා ගත් බව සනාථ කළ යුතු වේ.

(iv). බඳවා ගනු ලබන නිලධාරින් තුන් අවුරුදු පරිවාස කාලයකට යටත් වන අතර මෙම තනතුරේ සේවය බස්නාහිර පළාත තුලට සීමා වේ.

04. *වැටුප් පරිමාණයඃ*

අංක 03/2016 හා 2016.02.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ උපලේඛන I ට අනුව, මෙම තනතුරට අදළ මාසික වැටුප් පරිමාණය රු. 31,040 - 10 x 445 - 11 x 660 - 10 x 730 - 10 x 750 - රු. 57,550/-(MN 3-2016) වේ. නමුත් ඔබට වැටුප් ගෙවනු ලබන්නේ එම චක්‍රලේඛයේ විධිවිධානවලට අනුකූලව එහි උපලේඛන II හි සඳහන් පරිදි වේ.

05. පහත සඳහන් පරිදි පොදු සුදුසුකම් සම්පූර්ණ කර තිබිය යුතුයඃ

අ) ශ්‍රී ලාංකික පුරවැසියකු විය යුතුය.

ආ) බස්නාහිර පළාත තුළ ඕනෑම දිස්ත්‍රික්කයක සේවය කිරීමටත් තනතුරේ රාජකාරි ඉටුකිරීමටත් ප්‍රමාණවත් මනා ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

ඇ) අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට පූර්වාසන්නයෙන් අවම වශයෙන් වසර 03 ක වත් බස්නාහිර පළාතේ ස්ථිර පදිංචිකරුවකු විය යුතුය.

ඈ) වයස් සීමාව වයස අවු. 18 ට නොඅඩු හා අවු. 45 ට නොවැඩි විය යුතුය. (දැනට රාජ්‍ය/පළාත් රාජ්‍ය සේවයේ යෙදී සිටී නම් උපරිම වයස් සීමාව බල නොපැවැත්වේ.

ඉ) මෙම තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය මෙම නිවේදනයේ සඳහන් සියළුම සුදුසුකම් 2018.06.18 දිනට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතු අතර යහපත් චරිතයකින් යුක්ත විය යුතුය.

06. පහත සඳහන් පරිදි අධ්‍යාපන සුදුසුකම් හා වෙනත් සුදුසුකම් සම්පූර්ණ කර තිබිය යුතුයඃ

i. දෙවරකට නොවැඩි වාර ගණනකදී සිංහල/ දෙමළ භාෂාව, ගණිතය ඇතුළුව සම්මාන සාමාර්ථ 03ක් හා ඉංග්‍රීසි භාෂාවට සාමාන්‍ය සාමාර්ථයක් සහිතව විෂයයන් 06 කින් අ. පො. ස. (සා. පෙ.) විභාගය සමත්ව තිබිය යුතුය. ඉන් විෂයයන් පහක් (05) එකවර සමත් විය යුතුය.

*සහ*

ii. රජයේ (බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ ද ඇතුළුව) හෝ රාජ්‍ය සංස්ථාවක ක්‍රීඩා නිලධාරියෙකු වශයෙන් හෝ අදල ක්ෂේත්‍රයේ එවැනි තනතුරක වසර 05 ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

*සහ*

iii. ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 25 දරන ක්‍රීඩා පනත යටතේ අදල ක්ෂේත්‍රයට නියමිත ක්‍රීඩා පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද පුහුණුකරුවකුගේ බලපත්‍රයක් ලබා තිබීම.

*හෝ*

ජාතික ක්‍රීඩා විද්‍යායතනය හෝ යුධ/ නාවික/ගුවන් හමුදා අභ්‍යාස පාසලක මගින් මාස 06 කට නොඅඩු ක්‍රීඩා පුහුණුකරු පිළිබඳ ඩිප්ලෝමා සහතිකයක් ලබා තිබීම.

*නැතහොත්*

iv. ඉහත (i) සහ (iii) යටතේ සඳහන් සුදුසුකම් සම්පූර්ණ කරන ලද ජාත්‍යන්තර තරගවලදී ශ්‍රී ලංකාව නියෝජනය කළ ක්‍රීඩකයෙකු බව සනාථ කිරීම සඳහා එම ජාත්‍යන්තර තරග නියෝජනය කළ නියමිත ක්‍රීඩා පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද සහතිකයක් ලබා තිබිය යුතුය.

07. *බඳවා ගැනීමේ ක්‍රමය-*

අයදුම්කර ඇති එක් එක් ක්ෂේත්‍රයන් සඳහා වෙන් වෙන්ව සැකසූ ප්‍රශ්නපත්‍ර වලින් යුත් ලිඛිත පරීක්ෂණ වලට අයදුම්කරුවන් භාජනය කර ඉන් සමත් වන අයදුම්කරුවන් ප්‍රායෝගික පරීක්ෂණයක් සඳහා භාජනය කෙරේ. ලිඛිත පරීක්ෂණයේ හා ප්‍රායෝගික පරීක්ෂණයෙන් අයදුම්කරුවන් විසින් ලබා ගන්නා ලකුණු පදනම් කර ගනිමින් එක් එක්

ක්‍රීඩා ක්ෂේත්‍රය සඳහා සකස් කෙරෙන ප්‍රමුඛතා ලේඛනයන්හි ඉහළින්ම සිටින අයදුම්කරුවන් පුරප්පාඩු සංඛ්‍යාව අනුව සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයකට කැඳවා සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් අනතුරුව පුරප්පාඩු සඳහා බඳවා ගනු ලැබේ.

අයදුම් කරන ක්‍රීඩා ක්ෂේත්‍රය අනුව ලිඛිත පරීක්ෂණ වලට යොමු කිරීම හා ප්‍රමුඛතා ලේඛන සඳහා ඇතුලත් කිරීම සිදු කරන අතර ප්‍රායෝගික පරීක්ෂණය අසමත් වන අයදුම්කරුවන් අදාළ ප්‍රමුඛතා ලේඛන සඳහා ඇතුලත් නොකෙරේ. ඉල්ලුම් කරන ක්‍රීඩා ක්ෂේත්‍රය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

08. *ලිඛිත පරීක්ෂණය පිළිබඳ විස්තරː*

ක්‍රීඩා පුහුණුකරු බඳවා ගැනීමේ ලිඛිත පරීක්ෂණය ප්‍රශ්න පත්‍ර දෙකකින් සමන්විත වේ. මෙම විභාගය සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි මාධ්‍යවලින් පැවැත්වෙන අතර ඉල්ලුම් කරන මාධ්‍ය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ. ලිඛිත පරීක්ෂණයෙන් සමත් වීම සඳහා අවම වශයෙන් ලකුණු 40ක් අපේක්ෂකයන් විසින් ලබාගත යුතුය. ලිඛිත පරීක්ෂණයෙන් සමත් අයදුම්කරුවන් ප්‍රායෝගික පරීක්ෂණය සඳහා යොමු කරනු ලැබේ.

| *විෂය නිර්දේශය* | *මුළු ලකුණු* | *කාලය* | *උපරිම ලකුණු* | *සමත් ලකුණු* |
|---|---|---|---|---|
| 1. පුහුණු කිරීමේ න්‍යාය, වේගය, ශක්තිය, දරා ගැනීම, නමනීයතාවය, උලගිතාවය පිළිබඳ ක්‍රීඩා පුහුණු ක්ෂේත්‍රයන් පරීක්ෂාවට ලක්කරන කෙටි ප්‍රශ්න 60 කින් යුතු ප්‍රශ්න පත්‍රය | 60 | විනාඩි 45 යි | 100 | 40 |
| 2. පුහුණු ක්ෂේත්‍රයට අදල වන තවත් ප්‍රශ්න 02 කින් යුත් ප්‍රශ්න පත්‍රය | 40 | පැය 01 යි | | |

09. *ප්‍රායෝගික පරීක්ෂණය (කූපර් ටෙස්ට්) පිළිබඳ විස්තරː*

ලිඛිත පරීක්ෂණයෙන් සමත් අයදුම්කරුවන් ප්‍රායෝගික පරීක්ෂණය සඳහා යොමු කෙරේ. මෙම පරීක්ෂණයෙන් සමත් වීම සඳහා අවම වශයෙන් ලකුණු 40 ක් අපේක්ෂකයන් විසින් ලබාගත යුතුය.

| විෂය නිර්දේශය | මුළු ලකුණු | උපරිම ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|
| 1. මීටර් 1000- විනාඩි 04 | 20 | 100 | 40 |
| 2. මීටර් 50 - තත්පර 10 | 15 | | |
| 3. ෂටල් රන් - තත්පර 12 | 20 | | |
| 4. ස්ටැන්ඩ් ලෝන්ග් ජම්ප් - වැඩි දුර ප්‍රමාණය | 15 | | |
| 5. ඩිප්ස් - විනාඩියට ඩිප් ගණන | 15 | | |
| 6. ඇකියුරේට් ටාගට් | 15 | | |

10. *විභාග ගාස්තුː*

සෑම අපේක්ෂකයෙකුම විභාග ගාස්තුවක් බස්නාහිර පළාත් සභාවට ගෙවිය යුතුවේ. මෙම විභාගය සඳහා විභාග ගාස්තුව රු.600/- කි. එම විභාග ගාස්තුව, බස්නාහිර පළාත් සභා ආදායම් ශීර්ෂ 20-03-02-99 ට බැර වන ලෙස අයදුම්පත්‍ර භාරගනු ලබන අවසාන දිනට හෝ ඊට ප්‍රථම, බස්නාහිර පළාත තුල පිහිටා ඇති ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකට මුදලින් ගෙවා ඔබගේ නමින් ලබා ගන්නා ලදුපත අයදුම් පත්‍රයේ නියමිත ස්ථානයේ නොගැලවෙන සේ අලවා තිබිය යුතුය. එහි ඡායා පිටපතක් ලග තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. මෙම විභාගය සඳහා ගෙවන ලද ගාස්තුව කුමන කරුණක් නිසාවත් සම්පූර්ණයෙන්ම හෝ අර්ධ වශයෙන් හෝ ආපසු ගෙවනු නොලැබේ. තව ද විභාග ගාස්තුව සඳහා මුද්දර හෝ මුදල් ඇණවුම් භාරගනු නොලැබේ.

11. *අයදුම්කිරීමේ ක්‍රමයː*

(අ) අයදුම්පත්‍රය මෙම නිවේදනයට යා කොට ඇති ආදර්ශ ආකෘතියට අනුකූලව කඩදාසියේ දෙපසම පාවිච්චි කරමින් ඒ 4 ප්‍රමාණයේ කඩදසිවල පිළියෙළ කර අපේක්ෂකයා තම අත් අකුරින්ම පැහැදිලිව පිරවිය යුතුය. අංක 01 සිට 04 තෙක් ඡේදයන් පළමු පිටුවටද, අංක 05 සිට ඉදිරියට වන ඡේදයන් අනෙක් පිටුවලටද, ඇතුළත් වන සේ අයදුම්පත්‍ර පිළියෙල කර ගත යුතුය. නියමිත ආදර්ශ ආකෘතියට අනුකූල නොවන, නියමිත දිනට පෙර විභාග ගාස්තු ගෙවා නොමැති හා නිවැරදිව සම්පූර්ණ කර නොමැති, අසම්පූර්ණ තත්වයේ පවතින අයදුම්පත්‍ර කිසිදු දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. නිසි පරිදි අයදුම්පත්‍ර සම්පූර්ණ නොකිරීමෙන් සිදුවන පාඩුව අයදුම්කරුවන් විසින් දරාගත යුතුය. අයදුම්පත්‍රයේ ඡායා පිටපතක් ළඟා තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.

*(ආ)* අයදුම්පත්‍ර පිළියෙල කර ගන්නා විට එහි ශීර්ෂයේ සඳහන් විභාගයේ නම සිංහල අයදුම්පත්‍රවල සිංහලට අමතරව ඉංග්‍රීසියෙන් ද, දෙමළ අයදුම්පත්‍රවල දෙමළට අමතරව ඉංග්‍රීසියෙන් ද, සඳහන් කළ යුතුය.

*(ඇ)* සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍රය 2018.06.18 වැනි දින හෝ ඊට පෙර ලැබෙන සේ ''ලේකම්, බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව, නො 109, මහවිදිය, බත්තරමුල්ල'' වෙත ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත්‍ර බහා එවන කවරයේ වම් පස ඉහළ කෙළවරේ ''බස්නාහිර පළාත් ක්‍රීඩා අමාත්‍යාංශයේ ක්‍රීඩා පුහුණුකරු තනතුරේ 111 ශ්‍රේණියට බඳවා ගැනීමේ තරග විභාගය - 2018 '' යන්න පැහැදිලි ලෙස සඳහන් කළ යුතුය. මෙදිනට පසුව ලැබෙන කිසිම අයදුම්පත්‍රයක් භාරගනු නොලැබේ.

*(ඈ)* නිවේදනයේ සඳහන් සුදුසුකම් සහිත බව දක්වමින්, මෙම නිවේදනයට අනුකූලව සකසා ඇති නියමිත විභාග ගාස්තු ගෙවා නියමිත දිනට හෝ එදිනට පෙර හෝ අයදුම්පත් ඉදිරිපත් කර ඇති සියලුම අයදුම්කරුවන්ට නියමිත සුදුසුකම් සපුරා ඇතැයි යන පූර්ව නිගමනය මත තරග විභාගයට පෙනී සිටීමට බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් ඉඩදෙනු ලැබේ. සෑම ආකාරයකින්ම සම්පූර්ණ වී නැති අයදුම්පත්‍ර ප්‍රතික්ෂේප කරනු ඇත. තැපැල් කිරීමේදී අයදුම්පතක් නැතිවීම හෝ ප්‍රමාද වීම ගැන කෙරෙන කිසිම පැමිණිල්ලක් සලකා බලනු නොලැබේ. අපේක්ෂකයෙකුට විභාග ප්‍රවේශපත්‍රයක් නිකුත් කිරීම හෝ ප්‍රායෝගික පරීක්ෂණයකට කැඳවීම හෝ සම්මුඛ පරීක්ෂණයට කැඳවීම හෝ ඔහු/ ඇය මෙම තනතුර සඳහා සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස සලකනු නොලැබේ. අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයට කැඳවා නිවේදනයට අනුව අදාළ සුදුසුකම් තිබේදැයි පරීක්ෂා කරන අවස්ථාවේදී අවශ්‍ය සුදුසුකම් නොමැති බව අනාවරණය වූවහොත් ඔහුගේ / ඇයගේ අපේක්ෂකත්ව අවලංගු කෙරෙනු ඇත.

*(ඉ)* අයදුම්පත්‍ර ලැබුණු බව දන්වනු නොලැබේ. අයදුම්කරුවන් වෙත ප්‍රවේශපත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් නිවේදනයක් බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නිල වෙබ් අඩවිය www.psc.wp.gov.lk මගින් පළ කරනු ඇත. නිවේදනය පළවී දින 02 ක් හෝ ගතවූ පසුවත් ප්‍රවේශපත්‍රය නොලැබුණි නම් දැන්වීමේ සඳහන් ආකාරයට ඒ බව බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලය වෙත දන්වා සිටිය යුතු ය. ඔබ වෙත තබා ගත් අයදුම්පත්‍රයේ සහ මුදල් ගෙවූ කුවිතාන්සියේ ඡායා පිටපතක් ද, අයදුම්පත්‍රය ලියාපදිංචි කළ කුවිතාන්සිය ද, අතැතිව ඔබගේ සම්පූර්ණ නම, ලිපිනය, ජාතික හැඳුනුම්පත් අංකය හා විභාගයේ නම නිවැරැදිව සඳහන් කරමින් බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලයෙන් විමසිය යුතුය.

*(ඊ)* විභාග ප්‍රවේශපත්‍රයේ අත්සන් සහතික කිරීමට බලයලත් අයෙකු විසින්, අයදුම්කරුගේ අත්සන සහතික කළ යුතු ය. දැනටමත් රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ නියුතු නිලධාරීන් අත්සන අදාළ දෙපාර්තමේන්තු ප්‍රධානියා හෝ ඔහු වෙනුවෙන් එසේ කිරීමට බලයලත් නිලධාරියෙකු ලවා ද, අනෙකුත් අයදුම්කරුවන් අත්සන් සාමදාන විනිශ්චයකාරවරයෙකු, දිවුරුම් කොමසාරිස්වරයෙකු, නීතිඥවරයෙකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු, රජයේ විද්‍යාලයක විදුහල්පතිවරයෙකු, (රු. 240,360/-ක් හෝ ඊට වැඩි වාර්ෂික වැටුපක් ලබන රාජ්‍ය හෝ පළාත් රාජ්‍ය හෝ ස්ථිර මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරියෙකු) බෞද්ධ විහාරයක විහාරාධිපති හෝ නායක ස්වාමීන් වහන්සේ කෙනෙකු, අන්‍ය ආගමික පූජ්‍ය ස්ථානයක් භාර හෝ පූජ්‍ය පක්ෂයේ සැලකිය යුතු තත්ත්වයක් දරන පූජ්‍ය කෙනෙකු, ත්‍රිවිධ හමුදාවේ අධිකාරී බලයලත් නිලධාරිවරයෙකු, පොලිස් සේවයේ *ගැසට් කළ* තනතුරක් දරන නිලධාරියෙකු, හෝ යන මොවුන්ගෙන් කවරෙකු හෝ ලවා සහතික කරවා ගත යුතු ය.

12. *විභාගයට ඇතුල්වීම:*

(අ) නිවැරදිව අයදුම්පත් යොමු කර ඇති සියලුම අයදුම්කරුවන් වෙත බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් ප්‍රවේශපත්‍ර නිකුත් කරනු ඇත. විභාගයට පෙනී සිටින අපේක්ෂකයෙකු තමාට නියමිත විභාග මධ්‍යස්ථානයේදී විභාගයට පෙනී සිටිය යුතු අතර, එසේ පෙනී සිටින පළමු දිනයේදීම තම අත්සන සහතික කරවා ගත් ප්‍රවේශපත්‍රය ශාලාධිපති වෙත ඉදිරිපත් කළ යුතුය. තම ප්‍රවේශපත්‍රය ඉදිරිපත් නොකරන අපේක්ෂකයෙකුට විභාගයට පෙනී සිටීමට අවසර දෙනු නොලැබේ.

(ආ) විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් නියම කරන ලද නීතිරීතිවලට විභාග අපේක්ෂකයින් යටත් වේ. එම නීති රීති උල්ලංඝනය කළහොත් බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පනවනු ලබන දඬුවමකට යටත්වීමට ඔවුනට සිදුවනු ඇත.

13. *අපේක්ෂකයාගේ අනන්‍යතාවය:* තමා පෙනී සිටින සෑම විෂයයක් සම්බන්ධයෙන්ම විභාග ශාලාධිපති සෑහීමකට පත්වන අයුරින් අපේක්ෂකයන් විභාග ශාලාවේ දී තම අනන්‍යතාව ඔප්පු කර සිටිය යුතු ය. අපේක්ෂකයන්ගේ අනන්‍යතාව සනාථ කිරීම සඳහා පහත සඳහන් ලියවිලි වලින් එකක් විභාග ශාලාධිපති වෙත ඉදිරිපත් කළ යුතුය.

i) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරන ලද වලංගු ජාතික හැඳුනුම්පත
ii) ආගමන විගමන දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද වලංගු විදේශ ගමන් බලපත්‍රයක්

14. *සාවද්‍ය තොරතුරු සැපයීම:* අපේක්ෂකයෙකුට සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් විභාගයට පෙර හෝ විභාගය පැවැත්වෙද්දී හෝ විභාගයෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවක දී, ඔහුගේ/ ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ ඇත. අයදුම්කරු විසින් ඉදිරිපත්කරන ලද තොරතුරක් ඔහු/ ඇය එය සාවද්‍ය බව දන දනම ඉදිරිපත් කර ඇති බව හෙළිවුවහොත් එසේ නැතිනම් යම් වැදගත් කරුණක් ඔහු/ ඇය විසින් උවමනාවෙන්ම යටපත් කර ඇති නම්, ඔහු/ ඇය රජයේ සේවයෙන් පහ කිරීමට ඉඩ ඇත.

15. *විභාග ක්‍රමය:*
   (i) මෙම විභාගය සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි මාධ්‍යවලින් පැවැත්වේ.
   (ii) අපේක්ෂකයෙකු විභාගයේ දී පෙනී සිටින සියලුම ප්‍රශ්න පත්‍රවලට එකම භාෂාවකින් පිළිතුරු ලිවිය යුතු ය.

16. මෙම විභාගයෙන් සුදුසුකම්ලත් අපේක්ෂකයින්ගේ නම් ඇතුළත් ප්‍රතිඵල ලේඛණය බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අයදුම්කරුවන් වෙත පෞද්ගලිකව ප්‍රතිඵල දන්වා යැවීම, තැපැල මගින් හෝ බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ www.psc.wp.gov.lk නිල වෙබ් අඩවිය ඔස්සේ සිදු කරනු ඇත.

17. මෙම අයදුම්පත් කැඳවීමේ නිවේදනයෙන් අනාවරණය වන/ නොවන අදාළ කරුණු පිළිබඳව අවසන් තීරණය බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතුවේ.

18. මෙම පුවත්පත් නිවේදනය සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි අනුවාද අතර යම් අනනුකූලතාවයක් ඇති වූවහොත් එවිට සිංහල භාෂා පාඨ බල පැවැත්විය යුතුය.

හේමන්ත සමරකෝන්,
ලේකම් *(වැ.බ)*,
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
බස්නාහිර පළාත.

2018 මැයි මස 08 වැනි දින,
බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලය,
අංක. 109,
මහවීදිය, බත්තරමුල්ල.

ආදර්ශ අයදුම්පත්‍රය

**බස්නාහිර පළාත් ක්‍රීඩා අමාත්‍යාංශයේ ක්‍රීඩා පුහුණුකරු III වැනි ශ්‍රේණියට බඳවා ගැනීම සඳහා වන විවෘත තරග විභාගය - 2018**

Open Competitive Examination For Recruitment To Grade 111 Of Western Provincial Sport Ministry Sport Corch - 2018

☐
(කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා)

* විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය :
සිංහල - 2
දෙමළ - 3 ☐
ඉංග්‍රීසි - 4
(අදාල අංකය කොටුව තුළ ලියන්න)

1.0 1.1 සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) :- ..................................................................................................................
..................................................................................................................
(*උදා:*HERATH MUDIYANSELAGE SAMAN KUMARA GUNAWARDHANA)

1.2 අගට යෙදෙන නම මුලින් ද අනෙකුත් නම් වල මුලකුරු පසුව ද යොදා නම (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) :-.........................
..................................................................................................................
(*උදා:*GUNAWARDHANA, H.M.S.K.)

1.3 සම්පූර්ණ නම (සිංහලෙන්/දෙමළෙන්) - ..................................................................................................................
..........................................................................................

1.4 ජාතික හැඳුනුම්පත් අංකය : | | | | | | | | | | |

2.0 2.1 ස්ථිර ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :-..............................................................................................................
.............................................................................................................................................................................

2.2 ස්ථිර ලිපිනය (සිංහලෙන්/ දෙමළෙන්) :- ......................................................................................................................
.............................................................................................................................................................................

2.3 විභාග ප්‍රවේශ පත්‍රය එවිය යුතු ලිපිනය :
i. සිංහලෙන්/දෙමළෙන් - ......................................................................................................................................
ii. ඉංග්‍රීසි කැපිටල් අකුරින් - ..................................................................................................................................

2.4 දුරකථන අංකය -
පුද්ගලික- ........................................ රාජකාරි- ........................................

3.0 3.1 ඔබ දැනට රැකියාවක නිරත වන්නේනම් දරන තනතුර :- ............................................................................................

3.2 අදාළ තනතුරේ පත්වීම් දිනය හා 2018.06.18 දිනට සේවා කාලය : ...........................................................................

3.3 අදාළ තනතුර අයත්වන ක්ෂේත්‍රය :- ..................................................

3.4 ඔබ විසින් දරන තනතුර අයත් වන්නේ රජයේ/පළාත් රාජ්‍ය සේවයේ/රාජ්‍ය සංස්ථාවක/වෙනත් ආයතනයකට ද යන්න සඳහන් කරන්න. :- ..........................................................................................

3.5 අදාළ ආයතනයේ නම හා ලිපිනය :- ..................................................................................................................

3.6 රාජකාරි දුරකතන අංකය :- ..............................................................................................................................

4.0 ස්ත්‍රී/පුරුෂ භාවය - (අදාළ අංකය කොටුව තුළ ලියන්න)
පුරුෂ - 0
ස්ත්‍රී - 1 | |

4.1 අයදුම්කරුගේ ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය - කොළඹ - 1
ගම්පහ - 2
කළුතර - 3 | | (අදාළ අංකය කොටුව තුළ ලියන්න)

4.2 ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය - ...............................................................................................

4.3 බස්නාහිර පළාතේ ස්ථිර පදිංචි කාලය - අවු: | | | මාසඃ | | | දිනඃ | | |

4.4 ඔබ ශ්‍රී ලංකා පුරවැසියෙකු වන්නේ උපතින් ද? ලියාපදිංචියෙන් ද? ...................................................................................

4.5 විවාහක/අවිවාහක බව - විවාහක - 2 අවිවාහක - 1 | |
(අදාල අංකය කොටුව තුළ ලියන්න)

4.6 උපන් දිනය : වර්ෂයඃ | | | | | මාසයඃ | | | දිනයඃ | | |

4.7 අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදුඃ | | | මාසඃ | | | දිනඃ | | |

5.0 අධ්‍යාපන සුදුසුකම්:

5.1 අ. පො. ස. (සා./පෙ.) විභාගය පිළිබඳ විස්තරය: පළමු වාරය

i. විභාගයේ වර්ෂය හා මාසය: වර්ෂය- ☐☐☐☐ මාසය- ☐☐
ii. විභාග අංකය: ..............................................
iii. ප්‍රතිඵල:

| විෂයය | සාමාර්ථය | විෂයය | සාමාර්ථය |
|---|---|---|---|
| 1. | | 6. | |
| 2. | | 7. | |
| 3. | | 8. | |
| 4. | | 9. | |
| 5. | | 10. | |

5.2 අ. පො. ස. (සා./පෙ.) විභාගය පිළිබඳ විස්තරය: දෙවන වාරය (අදාල වන්නේ නම් පමණක් සම්පූර්ණ කරන්න)

i. විභාගයේ වර්ෂය හා මාසය: වර්ෂය- ☐☐☐☐ මාසය- ☐☐
ii. විභාග අංකය: ..............................................
iii. ප්‍රතිඵල:

| විෂයය | සාමාර්ථය | විෂයය | සාමාර්ථය |
|---|---|---|---|
| 1. | | 6. | |
| 2. | | 7. | |
| 3. | | 8. | |
| 4. | | 9. | |
| 5. | | 10. | |

6.0 අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ අංක 6.0 අනුව ලබා ඇති සුදුසුකම්: (ඔබ විසින් ලබා ඇති සුදුසුකම්වලට ඉදිරියෙන් ඇති කොටුව තුළ / ලකුණ සටහන් කරන්න.)

(i) රජයේ (බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ ද ඇතුළුව) හෝ රාජ්‍ය සංස්ථාවක ක්‍රීඩා නිලධාරියෙකු වශයෙන් හෝ අදාළ ක්ෂේත්‍රයේ එවැනි තනතුරක වසර 05 ක සතුටුදයක සේවා කාලයක් සම්පූර්ණ කර ඇත. ☐

(ii) ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 25 දරන ක්‍රීඩා පනත යටතේ අදාළ ක්ෂේත්‍රයට නියමිත ක්‍රීඩා පාලක මණ්ඩලය විසින් නිකුත්කරන ලද පුහුණුකරුවකුගේ බලපත්‍රයක් ලබා ඇත. ☐

(iii) ජාතික ක්‍රීඩා විද්‍යායතනය හෝ යුධ/ නාවික ගුවන් හමුදා අභ්‍යාස පාසලක් මගින් මාස 06 කට නොඅඩු ක්‍රීඩා පුහුණුකරු පිළිබඳ ඩිප්ලෝමා සහතිකයක් ලබා ඇත. ☐

(iv) අයදුම්පත් කැඳවීමේ නිවේදනය පරිදි අ. පො. ස (සා. පෙ.) සුදුසුකම සමග ඉහත (ii) සහ (iii) යටතේ සඳහන් සුදුසුකම් සම්පූර්ණ කරමින් ජාත්‍යන්තර තරගවලදී ශ්‍රී ලංකාව නියෝජනය කළ ක්‍රීඩකයෙකු බව සනාථ කිරීම සඳහා එම ජාත්‍යන්තර තරග නියෝජනය කළ නියමිත ක්‍රීඩා පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද සහතිකයක් ලබා ඇත. ☐

7.0 ඔබ කවරදක හෝ කවර චෝදනාවක් සඳහා උසාවියකින් වරදකරු කරනු ලැබ තිබේ ද?
(අදාළ කොටුවේ ✓ලකුණ යොදන්න) ඔව් ☐ නැත ☐

''ඔව්'' නම් විස්තර සඳහන් කරන්න. ..........................................................................................

8.0 විභාග ගාස්තු ගෙවූ ලදුපත පිළිබඳ විස්තර : ...............................................
i. විභාග ගාස්තු ගෙවූ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය : ...............................................
ii. ලදුපත් අංකය හා දිනය : ................................
iii. ගෙවූ මුදල : ................................

| විභාග ගාස්තු ගෙවූ ලදුපත මෙම කොටුව තුළ නොගැලවෙන සේ අලවන්න. |
|---|

9.0 *අයදුම්කරුගේ සහතිකය* ඃ

*(අ)* මෙම ඉල්ලුම්පත්‍රයේ මවිසින් සපයා ඇති තොරතුරු මා දන්නා තරමින් සත්‍ය හා නිවැරදි බව ගෞරවයෙන් ප්‍රකාශ කර සිටිමි. මෙහි යම් කොටස් සම්පූර්ණ නොකිරීමේ සහ / හෝ වැරදි ලෙස සම්පූර්ණ කිරීමෙන් සිදුවිය හැකි අලාභය විඳ දරා ගැනීමට එකඟ වෙමි. මෙහි සියලුම කොටස් නිවරුදිව සම්පූර්ණ කර ඇති බව ද ප්‍රකාශ කරමි.

*(ආ)* මවිසින් කරන ලද මෙම ප්‍රකාශය අසත්‍ය යැයි ඔප්පු වුවහොත්, අදාළ තනතුර සඳහා පත්කරනු ලැබීමට නුසුදුස්සෙකු වන බව සහ පත්වීම ලැබීමෙන් පසු සේවයෙන් පහකරනු ලැබීමට යටත්වන බව ද මම දනිමි.

*(ඇ)* තව ද විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පනවනු ලබන නීතිරීතිවලට අනුකූලව ක්‍රියා කිරීමටත් මෙම විභාග කොන්දේසි අනුව මා නුසුදුස්සෙකු බව අනාවරණය වුවහොත් විභාගයට පෙර හෝ විභාගයෙන් පසුව හෝ මාගේ විභාග අපේක්ෂකත්වය අවලංගු කිරීමට ගනු ලබන තීරණයන් පිළිගැනීමට මා එකඟ වෙමි.

*(ඈ)* මෙහි සඳහන් කිසිදු තොරතුරක් පසුව වෙනස් නොකරමි.

..........................,
අයදුම්කරුගේ අත්සන.

දිනය ඃ........................ .

10. *අයදුම්කරුගේ අත්සන සහතික කිරීම* ඃ

මෙම අයදුම්පත ඉදිරිපත්කරනු ලබන ........................................................................ මයා/මිය/මෙනවිය මා පෞද්ගලිකව දන්නා හඳුනන බවත් ඔහු ඇය නියමිත විභාග ගාස්තුව ගෙවා ඇති බවත්, එම ලදුපත අයදුම්පතෙහි අලවා ඇති බවත් ඔහු/ඇය .................................. වැනි දින මා ඉදිරිපිට දී ඔහුගේ/ඇයගේ අත්සන තැබූ බව ත්, සහතික කරමි.

.............................................,
අත්සන සහතික කරන නිලධාරියාගේ
අත්සන හා නිල මුද්‍රාව.

දිනය ඃ........................
සහතික කරන නිලධාරියාගේ සම්පූර්ණ නම ඃ........................
තනතුර ඃ........................
ලිපිනය ඃ........................

රජයේ සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය ඃ

මෙම අයදුම්පත ඉදිරිපත් කරනු ලබන .............................................................. මයා/මිය/මෙනවිය දැනට .............................. .......................................................... කාර්යාලයේ/ආයතනයේ ..................... දින සිට මේ දක්වා .............................................. .................. (තනතුර) වශයෙන් ස්ථිර/තාවකාලික/අනියම් (අනවශ්‍ය වචන කපා හරින්න) තනතුරක සේවය කරන බව ද, ඔහු/ඇය 2018.06.18 වැනි දිනට වසර 05 ක සතුටුදායක සේවා කාලයක් සපුරා ඇති බව ද, මෙම තනතුරෙහි පත්වීමක් සඳහා ඇය/ඔහු තෝරාගනු ලැබුවහොත් ඔහු/ඇය දැනට දරන තනතුරින් නිදහස් කරන බව ද/ නොකරන බව ද, ඉහත සඳහන් කර ඇති තොරතුරු සත්‍ය බව ද සහතික කරමි.

.........................................
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන.
(නිල මුද්‍රාව තබන්න.)

දිනය ඃ........................ .
සහතික කරන නිලධාරියාගේ නම ඃ........................ .
තනතුර ඃ........................ .
ලිපිනය ඃ........................ .

05 - 766

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.